# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු කැඳවීම

## ිතුරු මං පෙත්‌ ජාතික මහාමාර්ග දෙපස සෙවණ ශාක සිටුවීමේ ව්‍යාපෘතිය - 2024

## බස්නාහිර පළාත

## කොන්ත්‍රාත් අංකය - RDA/PD(W)/W/TEN/TP/01

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, තුරු මං පෙත් - ජාතික මහාමාර්ග දෙපස සෙවණ ශාක සිටුවීමේ ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2. මාර්ග සංවර්ධන අධිකාරිය විධායක නියෝජිතායතනය වේ.

3. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

4. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් දක්වා ලංසු වලංගු විය යුතුය.

5. ලංසුව, රු. 37,800.00 ක වටිනාකමකින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය. (2024.11.26 දින දක්වා වලංගු විය යුතුය). ඕනෑම වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ලංසු ලියවිලි ඇතුළත් සෑම පිටුවක්ම ලංසුකරු විසින් අත්සන් තැබිය යුතු අතර ඔහුගේ නිල මුද්‍රාව තබන ලෙසද ඉල්ලා සිටිනු ලැබේ.

7. පූර්ව ලංසු රැස්වීම 2024.07.23 දින පෙ.ව. 10.00 ට අදාල පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලවලදී පැවැත්වේ.

8. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල තුළදී කිසිදු ගෙවීමකින් තොරව කාර්යාල වේලාව තුළදී ලංසු ලේඛන පරීක්ෂා කළහැක.

9. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.07.09 දින සිට 2024.07.29 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ ආපසු නොගෙවනු ලබන රු. 3,000.00 ක (වැට් - ආරක්ෂණ බදු සහිත) ගාස්තුවක් සහිතව ලිඛිත අයදුම්පතක් අදාල පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල වෙත ඉදිරිපත් කිරීමෙන් සම්පූර්ණ ලංසු අයදුම්පත් කට්ටලයක් ලබාගත හැකිය. 2024.07.30 දින පෙ.ව. 10.00 ට ලංසු භාර ගැනීම අවසන් වේ.

10. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව නියමිත දිනට හා වේලාවට පෙර බස්නාහිර පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයල මාර්ග සංවර්ධන අධිකාරිය අංක 36 උඩුමුල්ල පාර බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. ලංසු බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "තුරු මං පෙත් - ජාතික මහාමාර්ග දෙපස සෙවණ ශාක සිටුවීමේ ව්‍යාපෘතිය - 2024" යනුවෙන් සඳහන් කළ යුතුය.

11. බස්නාහිර පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයල මාර්ග සංවර්ධන අධිකාරිය අංක 36 උඩුමුල්ල පාර බත්තරමුල්ල කාර්යාලයේදී ලංසු භාරගැනීම අවසන්වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගීවිය හැක.

12. වැඩිදුර විස්තර සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය) දුරකථන අංක 0112862445 මගින් හා පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය දුරකථන අංක 0112863916 ඇමතිය හැක.


සභාපති
බස්නාහිර පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය ප්‍රසම්පාදන කමිටුව
මාර්ග සංවර්ධන අධිකාරිය
අංක 36 උඩුමුල්ල පාර බත්තරමුල්ල